# ප්‍රවෘත්ති හා ප්‍රවෘත්ති වාර්තාකරණය

සමන් රාජපක්ෂ

## හැඳින්වීම

නූතන මිනිසා තොරතුරු මිනිසෙකි. එසේ ම සමාජය තොරතුරු සමාජයකි. සමාජය සංසිඳවිය නොහැකි මට්ටමේ ප්‍රබල වූ තොරතුරු පිපාසයකින් පෙළෙයි. මේ තත්ත්වය නිසා ම මිනිසා කල් ගෙවන්නේ කුතුහලයෙන් හා අවට පරිසරය ගැන සුදුමාකාර වූ විමර්ශනශීලීත්වයකිනි. ඉතාමත් තරඟකාරී ආර්ථික ක්‍රමයක් හා සමාජ ක්‍රමයක් තුළ ජීවත් වන වත්මන් මානවයාට එම තරඟකාරීත්වයෙන් ජයගැනීම වෙනුවෙන් තමන් අවට සිදුවන ක්‍රියාවලීන් පිළිබඳව දේශපාලනික හා සංස්කෘතික පරිවර්තනයන් පිළිබඳව දැනුවත්භාවයකින් යුතුව කල් යවන්නට සිදුවෙයි.

තත්පරයක් තුළ ලෝකයේ ඕනෑ ම තැනක බලපෑම් ඇතිව හෝ නැතිව සිදුවන්නා වූ සිදුවීම් සන්නිවේදනය කරනු ලබන්නේත්, වාචිකව හෝ ලිඛිතව වාර්තා කරන්නේත්, තොරතුරු මගිනි. එවැනි වූ ලක්ෂ සංඛ්‍යාත සිදුවීම් අතරින් සමාජය නිතර ම පිරිපුන්ව පවතී. මේ ආශ්‍රයෙන් ගොඩනැගෙන්නා වූ තොරතුරු එක්තරා අන්දමින් මිනිසාට වැදගත් වන්නාසේ ම අවැදගත්වීමට පිළිවන. නමුත් එහි තොරතුරු ඔස්සේ තමන්ගේ පැවැත්මට එල්ලවන බලපෑම් පදනම් කරගෙන ඒ වෙනුවෙන් ක්‍රියාත්මකවීමට මිනිසා පෙළඹී සිටී(අමරසිරි,2004).

තොරතුරු යන්න මෙලෙස විග්‍රහ කර දක්වන්නේ නම් ප්‍රවෘත්ති යන්න පිළිබඳව ද විග්‍රහ කළ යුතුව ඇත. එසේ නම් ප්‍රවෘත්ති යනු මොනවා ද? ප්‍රවෘත්ති යන්න තොරතුරුවලින් වෙනස්වන්නේ කෙසේ ද යනාදිය පිළිබඳව මුලින් ම අවධානය යොමුකළ යුතුව ඇත. ඒ අනුව සෑම තොරතුරක් ම ප්‍රවෘත්තියක් වශයෙන් සැලකිය නොහැකිය. ජනමාධ්‍ය විසින් සිදුකරනු ලබන්නේ තොරතුරු අතරින් තෝරාගත් අනාලෝස්සක් වාර්තා කිරීම, අර්ථකථනය හා ඒහා සම්බන්ධ මතය ප්‍රකාශ කර දැක්වීම පමණී. එහෙයින් ලෝකයේ සිදුවන සිදුවීම් අතුරෙන් ජනමාධ්‍ය මගින් සමාජගත කළ යුතු යැයි යම් වටිනාකමක් වැදගත්කමක්, ඇත්තේ යමක් ද ඒ සියලු දේ ප්‍රවෘත්ති ගණයෙහි ලා සලකනු ලබයි.

එමෙන් ම ප්‍රවෘත්ති යන්න මෙලෙස පුද්ගල ජීවිතයට වැදගත්වනුයේ ඒවායේ අන්තර්ගතය හා ඒ ආශ්‍රිතව ගොඩනැගුන තොරතුරු පුද්ගලයාගේ තරඟකාරී ජීවිතයට විවිධ ස්වරූපයන් යවමින් බලපෑම් කරන නිසාය. මෙපරිද්දෙන් ප්‍රවෘත්ති යන්න සෘජුව ම සමාජ ප්‍රගමනය වෙනුවෙන් ඉවහල් වන බව කිව හැකිය. ඉහතින් දැක් වූ පරිදි මිනිසාගේ තොරතුරු දැනගැනීමේ පිපාසාව හෙවත් ප්‍රවෘත්ති පසුපස හඹායාමේ යථාර්ථයවන්නේ ප්‍රවෘත්ති හරහා සිදුවන සමාජ හා පුද්ගල පරිවර්තනයයි.